# 26. දෙව් වදනින් ආලෝකයක්

**මිහිපිට දේවරාජ්‍යය ස්ථාපනය කිරීම, ජේසුස් වහන්සේගේ සේවයේ, විශේෂිත අරමුණක් විය. එය ඉටුකර ගැනීමට, ජනතාව දැනුවත් කිරීමට විවිධ ඉගැන්වීම් ක්‍රම උපයෝගි කරගත් සේක. තම දේශන මගින් අවබෝධය ලබා දීම එක් මාර්ගයක් විය. අද අප යොමු වන පාඩම, ඒ පිළිබඳ අධ්‍යයනයකි. ශු. ලූක් තුමා ඉදිරිපත් කර ඇති මිටියාවතේ දේශනය ගැන වාර්තාව අපට පිටුවහලකි.**

**ශු. ලූක් 6**

**මතෙව් සුබසුනෙහි 5-7 පරිච්ඡේදවල ඇති කන්ද උඩ දේශනයේ හරය ලූක් සුබසුනෙහි 6 වන පරිච්ඡේදයේ ඇති බව පෙනේ.**

විශිෂ්ට ගුරුවරයකු ලෙස තක්සේරු ව ලත් ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම, පොදු ජනතාවට පිළිගැන්වූයේ ඇරමෙයික් භාෂාවෙනි. උන්වහන්සේට සවන් දීමට පැමිණි අය ඇමතීමට, පරිසරය ආශ්‍රිත මුහුදු වෙරළ, කඳු මුදුන් හා මිටියාවත් තෝරාගත් සේක. අද අප අධ්‍යයනය කරන්නේ ජේසුස් වහන්සේ මිටියාවතක දී දෙසූ දේශනයකි.

**ශු. ලූක් 6: 20-26**
**භාග්‍ය හා අභාග්‍යය**

ධනවත්කම දේවාශිර්වාදයේ ලකුණක් ලෙස ද දිළිඳුකම ශාපලත් බවේ ලකුණක් ලෙස ද ජුදෙව්වරු පිළිගත්හ. නමුත් ජේසුස් වහන්සේ දිළිඳුකම ආදර්ශ කොටගෙන ආධ්‍යාත්මික සත්‍යයක් ප්‍රකාශ කළ සේක.

දිළිඳු වූ ඔබ භාග්‍යවන්තය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය. දිළින්දාට තම අඟ හිඟකම් දැනේ. නමුත් දේව වචනයේ හරය ගැන නොදැනුවත් වුවත් දෙවිඳුන්ගේ සරණ, පිහිට පැතීමට, උන්වහන්සේ තුළ රැඳී සිටීමට දිළිඳු වන්නෝ භාග්‍යවන්තයෝ ය. උන්වහන්සේ උදෙසා දිළිඳුවීම ආශිර්වාදයකි. මෙලොව දිවිගමන තුළ දෙවිඳුන් තුළ රැඳෙන සියල්ලන්ට දේවරාජ්‍යයේ උරුමය ලැබේ.

දැන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔබ තෘප්තිමත් වනු ඇත. තමාගේ ආත්මික වුවමනාවට ඇති සාගින්න යහපත් ජීවිත පැවැත්මේ රහස ය. එම අඩුව සම්පූර්ණ වීමෙන් තෘප්තිය ඇතිවේ.

දැන් කඳුලු හෙළන ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔබ සිනාසෙනු ඇත. තමාගේ මෙන් ම අන්‍යයන්ගේ දුර්වලතා ගැන සංවේදී ව - දයානුකම්පාව දැක්වීම තුළ සැහීමට පත්වනු ඇත. දේව රාජ්‍යය උදෙසා නින්දා පීඩා, ප්‍රතික්ෂේපයට ලක්වන අයට, නිසි විපාක, එනම් භාග්‍යය හිමි වනු ඇත.

## අභාග්‍යය

අහෝ ධනවත් වූ ඔබට වන විපතක මහත - ඔබේ සැපවත් ජීවිතය විඳ හමාර ය. ධනය, නිර්ධනයන් නඟා සිටුවීමට පරාර්ථකාමීව වැය නොකිරීම හා ධනය ගැන උඩඟුවීම අභාග්‍යකි. - දෙවිඳුන්ගේ පිහිට නුවුවමනා වන තරමට ධනවත් වීම ශාපයකි.

අහෝ දැන් පෘෂ්ටිමත් ව වන ඔබට වන විපතක මහත - ඔබට සාගිනි වනු ඇත. ආත්මාර්ථකාමයෙන් වෙළී, ලෞකිකත්වයට වහල් වී ජීවත් වන්නවුන්ට එම පැවැත්මේ හිස්කම අත්විඳීම අභාග්‍යකි.

අහෝ දැන් සිනාසෙන ඔබට වන විපතක මහත- ඔබ හඬා වැළපෙනු ඇත. තමාගේ ජීවිතයේ අඩුවක් නැතැයි සිතමින් දේව පිහිට පිටු දකිමින් කල්ගෙවන අයට අභාග්‍යය අත්විඳීමට සිදුවේ.

වංක ජීවිත පැවැත්ම අනුව බාහිර ආටෝපය විදහා පෑමෙන් ව්‍යාජ පැසසුම ලැබීමට ප්‍රිය කරමින් ජනප්‍රියත්වය ලබන්නෝ ශාප ලබන්නෝ ය. නියත සැපත කරා යොමු විය හැකි ආකාරය හා විපත කරපින්නා ගත හැකි මාර්ගය, ජේසුස් වහන්සේ පැහැදිලි ව අනාවරණය කළ සේක.

## ප්‍රේමයෙන් සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම

**ශු. ලූක් 6: 27-36**

ප්‍රේමය, කිතු දහමේ, උතුම් ක්‍රියාකාරී ගුණ දහමකි. 'අගපේ' නැමැති ග්‍රීක් වචනයෙන් අර්ථවත් වන්නේ, සියලු බාධක අභිබවා, අන්‍යයන්ට යහපත සැළසෙන ප්‍රේමය යි. එය එලදායි ක්‍රියාමාර්ගයකි. අපගේ හිතවතුන්ට ප්‍රේම කිරීම ස්වභාවික ය. එහෙත් සතුරන්ට ප්‍රේම කිරීම විරල ගුණයකි. අවංක ප්‍රේමය තුළ සතුරන්ට වුව ද යහපත සැලසිය හැක. නොදන්නා කෙනෙකුට යායුතු මඟ පෙන්වා දීම උතුම් ගුණාංගයකි. ප්‍රේමයේ උල්පත අපගේ දෙවිඳාණෝය.

**ජේසුස් වහන්සේ වදාළ රන් අණ - 6: 31 අපට පවසන්නේ කුමක් ද?**
**අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තෙහු ද ඔබත් ඒ දේ ම ඔවුන්ට කරන්න.**

ජේසුස් වහන්සේගේ මෙම ශ්‍රේෂ්ට ඔවදන අනුව අපට මග පෙන්වා ඇත්තේ යහපත

වර්ධනය කරමින් ඉදිරියට යමින් එකිනෙකා අතර ප්‍රේමයෙන් බැඳී සුහදතාවයෙන් දිවි ගෙවීමට ය.

විනිශ්චය කිරීම පිළිබඳ ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ පුරවැසියන්ට සාධාරණ මිණුම් දණ්ඩක් දුන් සේක. ඊට හේතුව අනුන් විනිශ්චය කිරීමට අපට අයිතිවාසිකමක් නොමැති වීම ය.

## ලූක් 6:37-42

ජේසුස් වහන්සේ වදාළ උපමාව අනුව අන් අය විනිශ්චය කිරීමට පළමු ව අප තුළ ඇති අයහපත් දෑ ඉවත දැමිය යුතු ය. ඒවා අන්‍යයන්ගේ සුළු අඩුපාඩුවලට වඩා බරපතල විය හැක. එම නිසා දේව රාජ්‍යයේ පුරවැසි චරිත ලක්ෂණවලට අනුකූල ව දෙවියන් වහන්සේ අපේ සියළු පාපවලට කමා වී ඇති බැවින් අපද එලෙස ම විනිශ්චය කිරීමෙන් තොර ව කමා විය යුතු වේ.

ඵලවලින් ගස හඳුනාගත හැකි සේ අපගේ ක්‍රියා මගින් අපගේ අනන්‍යතාවය හෙළිවේ. ලූක් 6: 43-45. අපගේ ජීවිත පැවැත්ම, හැසිරීම, කථා විලාශය නිතර ම අන්‍යයන්ගේ යහපත පෙරදැරි කරගෙන කළ යුතු වේ. 45 වන පදය - සිතා බලන්න.

**"යහපත් මිනිසා තම සිතෙහි නිදන් කළ යහපත් දෙයින් යහපත් දෙය ද අයහපත් මිනිසා අයහපත් දෙයින්, අයහපත් දේද උපදව යි. මන්ද සිතින් උතුරා යන දෙය කටින් පිටවේ."**

නිවසේ දී, පාසලේදී, කියන, කරන සියල්ල ගැන කල්පනාකාරී ව ක්‍රියා කරන්නට සිතට ගන්න.

## ශු. ලූක් 6: 46-49
## අත්තිවාරම් දෙක

**අපගේ ජීවිතවල පදනම විය යුත්තේ කුමක් ද?**

මිටියාවතේ දේශනය මගින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කර ඇති ගුණධර්මයන් ය. පදනම නම් උන්වහන්සේගේ ඉගැන්වීම් නැමති පර්වතය මත ජීවිතයේ අත්තිවාරම, පදනම දැමීම ය. මෙය අසා සිටි ජනතාවගේ හදවත් තුළට කා වදින්නට වදාළේ අත්තිවාරම් දෙක නමැති අර්ථවත් උපමාවකි. "ගැඹුරට පොළොව කැණ අත්තිවාරම දැමීම" - එය පහසු ව්‍යායාමයක් නොවේ. නැණවතා පොළොව ගැඹුරට ම කැණ අත්තිවාරම දමන්නේ තම නිවස කල් පවතින ලෙස සවිමත් ව ගොඩ නැගීමට ය.

අපගේ ජීවිත ගමන තුළ නොසැලී ඉදිරියට යන්නට දේව වචනය නැමති පවතින අඩිතාලම අත්‍යාවශ්‍ය වේ. ජීවිත ගමනේ අපට එල්ල වන සියළු අභියෝගවලට නොසැලී මුහුණ දීමට, දේව වචනය ශක්තිමත්ය. කෙටි උපමා මගින් වදාල මෙම මිටියාවතේ දේශනය දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ජීවිත පැවැත්ම අර්ථවත් ව විස්තර වේ. මේ අනුව ජේසුස් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ යහපත් ජීවිත පැවැත්මකට යොමු වීමට ය. ලෝකය අගය කරන වටිනාකම් අභිබවා යන්නට මෙම අනර්ඝ අනුශාසනාව සියලු ම යුගයන්හි වෙසෙන දේව රාජ්‍යයේ පුරවැසියන්ට අපහසු වුවත් උත්සාහ කිරීමට අභියෝගයකි.

ක්‍රියාකාරකම

1. ධනවත්කම හා දිලිඳුකම පිළිබඳ ව ජේසුස් වහන්සේ පැහැදිලි කළ දේව රාජ්‍යයේ නිවැරදි අදහස කුමක් ද?

2. දරුවන්ට අයහපත කරන අය පිළිබඳ ව ජේසුස් වහන්සේ දුන් අවවාද ක්‍රියාත්මක කළ යුත්තේ මන් ද?